Australian Government

COVID-19 VACCINATION

# COVID-19 එන්නත් ලබා ගැනීමේ යාවත්කාලීන කළ උපදෙස්

2021 ජූනි 7

ඔස්ට්‍රේලියාවේ වෛද්‍ය විශේෂඥවරු දැන් අවුරුදු 60ට අඩු වැඩිහිටියන්ට Pfizer COVID-19 එන්නත නිදෙර්ශ කරති. කලින් වෛද්‍ය උපදෙස වූයේ අවුරුදු Pfizer එන්නත වඩාත් සුදුසු වන්නේ 50ට අඩු වැඩිහිටියන්ට බවටයි.

යාවත්කාලීන කරන ලද උපදෙස් නිකුත් කිරීමට හේතු වූයේ කලින් සිතුවාට වඩා දුලර්භ රුධිර කැටි ගැසීමේ තත්ත්වයක් ඇති වීමේ අවදානමක් අවුරුදු 50 සිට 59 වයස් කාණ්ඩය තුළ පැවතීමයි. මෙම තත්ත්වයට ත්‍රොම්බොසයිටොපීනියා සින්ඩ්‍රෝමය සහිත ත්‍රොම්බොසිස් හෝ TTS යනුවෙන් හැදින්වේ.

ඇස්ට්‍රාසෙනෙකා එන්නත අවුරුදු 60 සහ ඊට වැඩි අයට ලබා දෙනු ලැබේ. අවුරුදු 60ට වැඩි අය එන්නත් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ TTS මගින් ඇති වන අවදානම්වලට වඩා වැඩිය.

එන්නත ලබා ගැනීම TTS වැළදීමෙන් බරපතල ලෙස රෝගාතුර වීම හෝ මරණයට පත් වීම වළක්වා ගැනීමට හැකි වැදගත්ම ක්‍රමයයි. ලොව පුරා මිලියන ගණනක් වූ බොහෝ දෙනෙක් ප්‍රවේසම් සහිත ලෙස එනනත් ලබා ගෙන ඇත.

බරපතල හානිකර අතුරු ඵලයක් නැතිව පළමු ඇස්ට්‍රාසෙනෙකා COVID-19 එන්නත් මාත්‍රාව ලබා ගත් අයට දෙවන මාත්‍රාවද ලබා ගත හැක. මෙයට අවුරුදු 60ට අඩු වැඩිහිටියන්ද ඇතුළත් වේ.

දෙවන මාත්‍රාව ලබා ගැනීමෙන් COVID-19 වැළදීමෙන් බරපතළ ලෙස රෝගාතුර වීමට එරෙහි උපරිම ආරක්ෂාව ඔබට සැලසෙනු ඇත. ඔබ පළමු මාත්‍රාව ලබා ගෙන ඇත්නම් දෙවන මාත්‍රාව ලබා ගැනීමට දින නියම කර ගත යුතුය.

දැනටමත් ෆයිසර් එන්නත ලබා දෙන රජයේ එන්නත්කරණ සායන අවුරුදු 50-59 පුද්ගලයන්ට ෆයිසර් එන්නත ලබා දීම වහාම ආරම්භ කරනු ඇත.

ඔස්ට්‍රේලියාවේ සිටින ජනතාවට අපේ වෛද්‍ය විශේෂඥයන් මෙහි සහ විදේශයන්හි සාක්ෂි සහ දත්ත දිගටම සමාලෝචනය කරන බවට විශ්වාසය තැබිය හැක. සුදුසු සැම දෙනාම COVID-19 එන්නත ලබා ගැනීම සුදුසු බව නිදෙර්ශ කරනු ලැබේ.

ඔබේ එන්නත සඳහා දින නියම ක ගැනීමට **health.gov.au** වෙත යන්න

## වැඩි දුර තොරතුරු සඳහා

ඔබට COVID-19 එන්නත පිළිබඳ ගැටලු තිබේ නම් ඔබේ වෛද්‍යවරයා සමග කතා කරන්න, නැත්නම් **www.health.gov.au/covid19-vaccines-languages** වෙත යන්න. එසේත් නැතහොත් ජාතික කොරෝනා වෛරස උපකාරක අංකය **1800 020 080** ඔස්සේ අමතන්න. භාෂා පරිවතර්න සහ භාෂණ පරිවතර්න සේවා සඳහා **131 450** අංකය අමතන්න.